

14 වන පිටෙන්

ගායන කලාවේදී තමන්ගේම අනන්‍යතාවක් ගොඩනගා ගැනීමත් වැදගත් වෙනවා නේද?

තමන්ගේ කියා අනන්‍යතාවයක් ඇති කරගන්න කළින් තමන් කැමති වෙනත් ශිල්පීන් අනුකරණය කිරීම කවුරුත් කරන දෙයක්. ඒකත් එක්තරා විදියක අභ්‍යසයක් නිසා එය වරදක් ය කියන්නට බැහැ. ස්වතන්ත්‍ර නිර්මාණ කරගෙන යාමේදී ඉබේම වාගේ අනන්‍යතාවය ගොඩ නැගෙනවා. එහි පෙර ගමන් කරුවන්ගේ සෙවනැල්ල තිබෙන්න පුළුවන්. එයින් සම්පූර්ණයෙන්ම මිදෙන්නට අමාරුයි.

කලාකරුවෙක් අනිවාර්යයෙන්ම සංවේදී පුද්ගලයෙක්. පද රචනාවෙන් කියවෙන දේ තනුවට අනුව හැඟීම් බරව ගායනා කිරීමට මේ සංවේදී බව ඉවහල් වෙනවා. සාමාන්‍ය කෙනෙක් දකින් පරිසරය නෙවෙයි කලාකරුවකු දකින්නේ. වඩාත් චමත්කාර විදිහට. පද මාලාව, තනුව කියන්නේ භාව ප්‍රකාශණ. ඒ දේවල් එක් කරගෙන ගායනීය භාව ප්‍රකාශයක් කිරීමයි ගායකයා සතු වගකීම.

යමක් ලබාගන්නවාට වඩා එය ආරක්සා කරගන්න අපහසුයි කියලා කියමනවක් තියෙනවානෙ.. ගායන ලොවේ ලබාගන්නා ජනප්‍රිත්වය හෝ ස්තාවරත්වය ගැන ඔබ මොනවද හිතන්නෙ.?

දැන් බලන්න. ගෙයක් තනා ගන්නවාට වඩා එය අව්වැසි සුළං වලින් රැක ගන්න එක අපහසුයි නේද? එය නඩත්තු කරන්නට ඕනෙ.. පිළිසකර කරන්නට ඕනෙ.. ඒ වගේම තමයි මේ දේත්. කලා කරුවා නිරන්තරයෙන්ම පරිසරය පිලිබඳව සංවේදීව විමසිල්ලෙන් සිටින්නට ඕනෙ. එහි විපර්යාසයන් ට අනුව නැවුම් දේ ඉදිරිපත් කරන්ට ඕනෙ.
ඒ වගේම අප හමුවට එන නවක ශිල්පීන් පිළිබඳවත් අවබෝධයකින් ඉන්න ඕනෙ. අප සැමදාම රැඳී සිටිය යුතුය යන්න වැරදි සිතිවිල්ලක්. විලියම් ශේක්ෂ්පියර් කිවිඳුන් තමන්ගේ ජීවිතයේ අග භාගයේදී කියපු දෙයක් මගේ මතකයට එනවා.

ලෝකය රඟහලකි
එහි රඟන්නෝ අපි වෙමු
එකෙක් රැඟුමට එති
තවෙකෙක් රඟා පිටවෙත්
රැඟූ මුත් හෝ කවර
යුග හතක් ඇතුළත
ගෙවී යන බව නොරහසකි

යමෙක් අමාරුවෙන් උපයා ගන්නා දේ හොරකම් කිරීම පාපයක්. සංගීත ක්ෂෙත්‍රයේ බුද්දිමය මංකොල්ලය පිළිකුල් සහගත ලෙස කෙරෙනවා. ප්‍රවීණයන්ගේ නිර්මාණ සොරාගෙන එයින් යැපෙන නව රැල්ලක් තිබෙනවා. ඔබ ගායනා කළ රන් මලක් ගීයේ තනුවට වෙනත් වචන යොදා ගෙන දේශපාලන වේදිකා වල පවා ගැයුනා. ඒ වගේම නවකයන්ගේ නිර්මාණ සුළු සුළු වෙනස්කම් කර ප්‍රවීනයන්ගේ නමින් ඉදිරිපත් වුණ අවස්ථාවන්ද අපට දකින්නට ලැබෙනවා. ඒ පිලිබඳව යමක් කීවොත්..

ඒකට එකඟතාවය පල කරන්නට නම් කොහෙත් ම පැහැ. අපේ රටේ නීතිය ශක්තිමත් නැති කම මීට ප්‍රධාන හේතුවක්. පැරණි ගීත නැවත ගායනා කිරීමේ දී එය ප්‍රවේශමෙන් කළ යුතුයි. ඇත්තටම පැරැන්නන් අබිබවා යා යුතුයි කියලයි මට නම් හිතෙන්නෙ. විකෘති කිරීම නම් කිසි සේත් ම අනුමත කරන්න බැහැ.

කලා නිර්මාණයක් මගින් යම් සමාජ මෙහෙවරක් ඉටු විය යුතුව ඇතැයි මතයක් තිබෙනවා..

සෞන්දර්යාත්මක වටපිටාවක් ඇතිව නිර්මාණයක් රසිකයාගේ අත්දැකීමක් බවට පත්විය යුතුය යන්න මා දරන මතයයි. එය පොදු වූත් සදාකාලික වූත් අත්දැකීමක් විය යුතුයි. එවැනි අත්දැකීමකින් දැනුවත් වීම සමාජයක් යහපත් අතට හැරවීමට ගන්නා උත්සාහයක් වෙන නිසා මා එය අගය කරනවා. පද රචනාවන් තෝරාගැනීමේදී මා ඒ පිළිබඳව උනන්දු වෙනවා.

සන්නස ඔබ අතට පත්වන මේ මොහොත වන විට මෙල්බර්න් පුරවරයේ පැවැත්වීමට යෙදුන සුනිල් එදිරිසිංහයන්ගේ ප්‍රසංගයෙන් ඔබ අප රසවත් වී හමාරයි. ඉන් ලද මිහිරි වින්දනය චිරාත් කාලයක් මතකයේ රඳවා ගන්නට ඉවහල් වන ඔහුගේ නවතම ගී එකතුව අලුත් වැස්සක් සංගත තැටියත් මෙල්බන් නුවරුන් අතට පත්වෙලා මේ වන විටත්.

මේ පුරයේ සිංහල ගී ක්ෂෙත්‍රයේ නැවුම් පිබිදීමක් දක්නට ලැබෙන මේ වකවානුවේ අප හා සාකච්ඡා කරන්නට ඉතා උනන්දුවෙන් එක් වුණ සුනිල් එදිරිසිංහයනට කෘතවේදීත්වය පුදමින් මා ඔහුගෙන් සමුගත්තා.

එහෙනං අද කෝබි ගෙදර

බාලි දූවේ නඩුවකට
පටලැවී හුල්ලන
කෝබි පවසන්නේ
ඇත්තම ඇත්ත නං
අඅගේ හිතවතුන්නේ
මත වාද පිළිගත යුතු නං
මොකක්දෝ හොරයක්
තිබෙනවා නොවැ මේකේ

පිටි පැහි ඇතුළට
ගංජා කිලෝ හතරක්
වැදුණේ ඇයට රහසින්
කිසියම් අදිසි බලයක්
නිසාවෙන් වත් දැයි
විමසා බැලුමට වටී

කිලෝ හතරක බරක්
රාත්තල් නවයට වැඩියි
තමන්ගේ පිටි පැහියෙන්
අඩු වූ විට දි ඒ බව
දැනෙන්නා වාගෙම
කිලෝ තුන හතරක්
වැඩි උණාමත් ඒ බව
දැනෙන්නට ඒපායෑ

පුදුමයි ඕක නං
එසේ මෙසේ එකෙකුගේ
වැඩක් නොවන බව
බැගූ බැල්මට පෙනෙනවා
ඉස්සර නං ඔය වගේ
ජරා තකතීරු වැඩ කළ
මිනිසුන්ට ලෙඩ දාන
දෙවි වරුත් හිටියාලු
බුහුතයොත් හිටියාලු
කිසිම කමකට නැති

ඒ වගේ දෙය්යෙක්
නැත්නම් බුහුතයෙක්
ඔය වැඩේ කළ විදියට
විනිසුරුවරුන් හට
ඒත්තු ගන්නන්නට
පුළුවං උණා නං
කෝබි අද ගෙදර නේ

(Backpack පිටිපැසිය, පිටිපැහිය)

වි. ක. ධර්මබන්ධු

බෞද්ධාලෝක මාවත

මාර ගස් අතු විදා
වෙසක් සඳ වසාගෙන
විහිදෙනා කිරණ රැස්
කපුටු රැල සොරාගෙන
රාත්‍රිය හති දමයි
තරගයක් මවා ගෙන
දිළිසේවි කුඩු රැස්
මග දෙපස පුරෝගෙන

දනා නෙක නරඹ සිරි
රථ කවුළු විවර කර
සුරා සැල් කැසිනො පිටි
සතියකට වසාගෙන
තරගයේ දුක් කඳු ළු
තුටු කඳුළු බලාගෙන
වෙසක් සඳ බැස ගියා
පරාජය ලබාගෙන

ලක්ෂ්මන් කොඩිතුවක්කු
සිඩ්නි

පහන් වැට ට ලියන්න. සන්නස පහන් වැට කාව්‍ය නිර්මාණ විශේෂාංගයට ලැබෙන කවි අතරින් එක් කවියකට වටිනා ඩීවීඩී තැටියක් පිරිනැමීමට ඔස්ට්‍රේලියාව පුරා අව්‍යාජ ඩීවීඩී තැටි බෙදාහරින DBSJ එන්ටප්‍රයිස් සූදානම්

DBJS Enterprise Tel/Fax 03 8336

Pahan Weta. Sannasa PO Box 172
Reservior VIC 3073 Australia

පිතු සෙනෙහස

නෙතුමිණි ගලා හැලෙන
දරුදුක හදින් ගලන
පායන හිරු කිරණට
වියළී මැකී නොයාවී

පැටවුන් සිනා පුරන
පියවරු සතුට දකින
මොහොතක මා අඬවන
දැසින් කඳුළු හැලේවී

උරුමය අඳුරු රැයක
මධුවිත සතුට ගෙනෙන
පාළුව තනි යහනක
මරණය සිනා සලාවී

උදය ගෝවින්න

ළමයින්ලෑ අම්මාට කෙරෙන ආදර ආයාචනයයි

කාර බැඳන් නුඹ ඇවිදින් දස වසරක්   ගතවුනා
සාර සිරින්   නොම පිරුනත් සැමදා ලිප   මෙලවුනා
දාර පෙමින්   හැදූ දරුවන් අකුරු කරති   සතොසිනා
වාර කනින්   යුග දිවියේ ගැලවෙමු අපි   කැතරිනා

පුන් පොහොදා පැයූ හඳ වගේ නුඹේ පෙම්   හිනාව
සුන්   කරදා   දුක් ගින්දර ඒ දිනවල පින්   ගෙනාව
දැන්   පෙරදා   වගේ නැතිය හැමදාමත්   අදෝනාව
පින්   මිදිදා   එකතු වෙන්න හිත දහ අත   කල්පනාව

බදා මගේ ඇඟ ඉස්සර වගේ තුරුළු වී   ඉන්නට
එදා වගේ පන් පැදුරේ සතුටු සිතින් ගුලි   වෙන්නට
සදා අගේ   හොඳ හිත නුඹෙ දිනක් දෙකක් උණු   වෙන්නට
මෙදා මගේ   මොන කරුමෙට ඉඩක් නැද්ද එක්   වෙන්නට

හයට උදේ නැගිට් වෙලේ සිට නිදියන තුරු   වැරදා
ඇඟට වදේ   ඇතුලේ ගින්දර පිටවෙන්නේ   නැතිදා
හිතට නොදේ අබිනික්මන් කර යන්නට ගෙය   හැරදා
මොකට ළදේ ඉන්නද මා මේ දුක උහුලන්   හැමදා

දස   දිනකට   සැරයක්වත් නුඹෙ හොඳ හිත   උණුවෙන්නයි
හස කැටිකොට   මුහුණ පුරා පෙම් පාටක්   විහිදෙන්නයි
දස   වසකට   පෙර කාලය යලිත් වරක්   එළැඹෙන්නයි
රස   බැළුමට   යුග දිවියේ නැවතත් පිණ   පැදෙන්නයි

ශාස්ත්‍රපති හැරිස් පරකන්දෙණිය,
පෙන්රිත්

ඊ-පෙම ගැන බැඳුනු ඊ-විරහ ගීය

ඉස්සර වාගේ එවන්න ලිපියක් අන්තර්ජාලිත රැහැන්   දිගේ
ඉස්සර වාගේ කරන්න දෙඩුමක් එම්-එස්-එන් සේවයෙන්   අගේ
ඉස්සර වාගේ ගයන්න ගීයක් සිත ගත හද මත් කරන   මගේ
ඉස්සර වාගේ ලබන්න සතුටක් අද මට කල පින් මිදියි   වගේ

එදා වගේමත් පේරාදෙණියේ හඳ පායනවද කඳු   මුදුනින්
එදා වගේමත් මහවැලි නදියේ රැළි පෙරලෙනවද පෙණ   නගමින්
එදා වගේමත් ගලහ හන්දියේ මල් පෙති විසිරෙනවද   සුළඟින්
එදා වගේමත් මා සියුමැළියේ මා ගැන සිහිවෙනවද   සුසුමින්

පරිගණකයෙ විද්‍යුත් ලිපි ගොණුවට වෛරස් ආසාදනයක්   දෝ
දූරකථනයෙ පිරිවැය සීමා බිඳ අන්තර්ජාලය ගොළුවුනි   දෝ
විශ්ව ගමේ නිතරම දූටු සැවුළිඳු කරමළ සුදු පැහැ ගැන්වුනි   දෝ
වයි-ටූ-කේ දී බැඳි ඊ-පෙම්දම සයිබ(ර්) විශ්වයෙම මියගියෙ   දෝ

රසික සූරියආරච්චි
(pemgee.blogspot.com)